# උතුරු පළාත් රාජ්‍ය සේවයේ විමර්ශන නිලධාරී III ශ්‍රේණියට බඳවාගැනීමේ විවෘත හා සීමිත තරග විභාගය– 2016

උතුරු පළාත් රාජ්‍ය සේවයේ විමර්ශන නිලධාරී III ශ්‍රේණියේ පුරප්පාඩු05ක් සඳහා බඳවා ගැනීමේවිවෘත හා සීමිතතරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් 2016 සැප්තැම්බර් මස යාපනයේ දි පැවැත්වෙන බව දන්වා සිටිනු ලැබේ .අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **27.07.2016**වේ.

**02බඳවා ගැනීමේ සේවා කොන්දේසි**

02.12013.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද විමර්ශන නිලධාරීසේවයේ සේවා ව්‍යවස්ථාවේ අනුමත කරන ලද කොන්දේසි සහ බඳවා ගැනීමේ ව්‍යවස්ථාවේ විධිවිධාන යනාදිය හා ඒවායෙහි කලින් කලට සිදු කරනු ලබන වෙනස් කිරීම් වලටත්,ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා සමාජවාදි ජන රජයේ අංක 1817/30 සහ2013.07.03 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගන්නා ලද අයදුම් කරුවන් එම තනතුරේ 111 වැනි ශ්‍රේණියට පත්කරණු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසර 03 පරිවාස කාලයකට යටත් කරණු ලැබේ. මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි උතුරු පළාත් රාජ්‍ය සේවයේ විමර්ශන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගන්නා ලද දිනයේ සිට වසර 03 ක කාලයක් ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩයිම් විභාගයෙන් සමත්විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරු සහිත සේවයකි. එබැවින් මෙම පත්වීම් ලබන අය උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළයුතු බවට වූ කොන්දේසියට යටත්විය යුතුය.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන්නෙකු එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළයුතු බවට අනිවාර්ය වූ කොන්දේසියකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දි නිකුත් කරණු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 05 ක් අවසන්වීමට පෙර එහි සඳහන් දෙවැනි රාජ්‍ය භාෂාවකින් සමත්විය යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක කරණු ලබන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරණු ලැබේ . ඇතැම් පුරප්පාඩු හෝ සම්පූර්ණ පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත .

**03වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 **හි වැටුප් කේත අංක MN4-2016 අනුව** බඳවා ගනු ලබන විමර්ශන නිලධාරී III ශ්‍රේණියට,අදාල වන මාසික වැටුප් පරිමාණයරු: 31,490/= - 10x445 - 11x 660 - 10x730 - 5x 750 - 54,250/=වේ.(රු. 32,825/= **වැටුප් පියවරට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකින් සමත් විය යුතුය.) එහෙත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.**

**04සාමාන්‍ය සුදුසුකම්**

04.1 අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. එනම් මෙම අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වසර 06 ක කාලය තුළ අඩුම වශයෙන් වර්ෂ 03 ක් වත් උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටි අයෙකු විය යුතුය.

හෝ

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අඩුම වශයෙන් වර්ෂ 05 ක් වත් උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටි අයෙකු විය යුතුය.(සම්මුඛ පරීක්ෂණයේදී ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කළයුතුය.)

04.3 අයදුම්කරු උතුරු පළාතේ කුමන හෝ ප්‍රදේශයක සේවය කිරීමට හැකි පරිදිමනා ශරීර සෞඛ්‍යකින් හා හොඳ චරිතවත් පුද්ගලයෙක් විය යුතුය.

04.4 මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර, ඉල්ලුම් කරන ලද සුදුසුකම් ලබා තිබිය යුතු යි.

04.5 අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි වියු යුතුය. සීමිත තරග විභාගය මගින් බඳවා ගැනිම සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**05 අධ්‍යාපන සුදුසුකම්**

**05.1 විමර්ශන නිලධාරී III වනි ශ්‍රේණියසඳහාවිවෘත තරග විභාගය මගින් බඳවා ගැනිම**

අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීමග (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේග)

**සහ**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ව්‍යාපාර පරිපාලන උපාධි (B.B.A)හෝවාණිජවේදි උපාධි (B.Com) උපාධිය ලබා තිබිය යුතු ය.

**හෝ**

උසස් තාක්ෂණ ආයතනයකින් ලබාගත්ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතිකය(HNDA).

**05.2 විමර්ශන නිලධාරී III වනි ශ්‍රේණියසඳහාසීමිත තරග විභාගය මගින් බඳවා ගැනිම**

(i) අ.පො.ස(උසස් පෙළ)වාණිජ අංශයෙන් පරණ විෂය නිර්දේශිය යටතේ විෂයන් 04ක් ද, අලුත් විෂය නිර්දේශ යටතේ විෂයන් 03ක් ද සමත්වෙ යුතුය.

**හෝ**

(ii) අ.පො.ස(සාමාන්‍ය පෙළ)විභාගයේදි එකවරේදි භාෂා දෙමළ හෝ සිංහල, ගණිතය හා වාණිජ විෂය අතුළත්ව විෂයන් 04කින් සම්මාන සාමාර්තය ලබා විෂයන් 06 කින් සමත්විය යුතුය.

**සහ**

පහත සඳහන් පාඨමාලාවලින් එකකින් සමත් විය යුතු යි.

1. රජයේ කාර්මික විද්‍යාලයකින් ගිණුම්කරණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලොමාවරගිණුම්කරණය ඩිප්ලොමාවේ දෙවන වසර සම්පූරණ කර තිබිම
2. රජයේ කාර්මික විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයෙකින් ලබා ගත් ජාතික ඩිප්ලොමා සහතිකය(වාණිජ අධ්‍යයනය සමග විකණනය එක් විෂයක් ලෙෂ හදාරා තිබිම)
3. උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාවේ දෙවෙනි වසර සමත්ව තිබීම / රජයේ කාර්මික ආයතනයකින් ලබා ලත් වාණිජ ඩිප්ලෝමා සහතිකය
4. ගිණුම් පරිපාලනයකරන ආයතනයේ (London) අවසාන වසර සමත්විය යුතු යි.
5. (ICASL) පාඨමාලාවේ පළමු පියවර සමත්විය යුතු යි.

(iii) සේවා කාලය

අයදුම්කරු උතුරු පළාත් රාජ්‍ය සේවයේ කළමනාකර සහකාර සේවයේ වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**හෝ**

අයදුම්කරු උතුරු පළාත් රාජ්‍ය සේවයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක්සම්පූර්ණ කර තිබිම සමහම ගිණුම්කරණය එක් විෂය අතුලුව ලබාගත් උපාධිය ලබා තිබිය යුතුය.

## 06 බඳවාගැනීමේ ක්‍රමය

06.1 ලිඛිත පරීක්ෂණයක් පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනීමේ වැඩසටහන් ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව බඳවා ගනුලැබේ.මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරණු ලැබේ.අවශ්‍යවන සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරණු ලැබේ.අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා නොකර අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන අයදුම්කරුවන්ට විභාගයට පෙනිසිටීමට අවසර ලබාදෙනු ලැබේ.සම්මුඛ පරීක්ෂණයේ දී සියලු සුදුසුකම් පරීක්ෂාකරණු ලැබේ.ඒ සඳහා අමතර ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

06.2 ඉහත සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් ඔවුන් ලැබූ මුලු ලකුණුවල අනුපිලවෙල අනුව පත්වීම් ලබාදීම සඳහා තෝරාගනු ලැබේ.

06.3 පවතින පුරප්පාඩු වලින් 30% සීමිත තරග විභාග ඔගින් පුරවනු ලබේ.

06.4 පුරප්පාඩු වලින් 3% ක් ආබාධිත පුද්ගලයන් සඳහා වෙන් කර ඇත. පත්වීම් සඳහා තෝරා ගැනීමේදී ආබාධිත පුද්ගලයන් රාජකාරි කිරීමට එම ආබාධිත තත්වය රාජකාරියට බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතු ය.

## 07 විභාග ගාස්තු

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රු.500/= ක් මුදලක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **3401** දරණ තැන්පත් ගිණුමට ගෙවීම් කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවෙහි නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කරනු නොලැබේ.

## 08 ඉල්ලුම් කරන ක්‍රමය

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ ( සෙමී 21 x සෙමී 29) ප්‍රමාණයේ කොළයක 01 සිට 11.1 දක්වා වූ කොටස් පළමුවැනි පිටුවේත්, ඉතිරි ඒවා අනෙක් පිටුවේත් ඇතුලත්වන පරිදි අයදුම් පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2016.07.27** වැනි දිනට හෝ ඊට පෙර ලැබීමට හැකිවන පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාව, උතුරු පළාත අංක 393/48,කෝවිල් පාර, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08.2 අයදුම්පත්‍රයේ 1යටතේ අයදුම්කරුගේ නම සඳහන් කිරීමේ දී සම්පූර්ණ නමේ අවසානයට ඇති නම මුලින් සඳහන් කර අනකුත් මුල් අකුරු නමෙහි අගට සඳහන් කළ යුතුය.

**උදාහරණ:-**අයදුම් පත්‍රයේ 1හි SISIRA KUMARA . H.M. යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ විමර්ශන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාගය -2016"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.4 ඉහත විභාග දෙකටම අයදුම් කරන අයදුම්කරුවන් ඉල්ලුම්පත්‍ර වෙන් වෙන්ව යොමු කළ යුතු අතර විභාග ගාසීද වෙන් වෙන් වශයෙන් ගෙවිය යුතුය

08.5 අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගණු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ.විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය එවනු ලැබීම අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බව අදහස් නොකෙරේ.

08.6 අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට වත් කලින් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් ඒ බව පහත සඳහන් විස්තර සහිතව **ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය.(දුරකතන අංකය 021- 221 9939, ෆැක්ස්අංකය 021- 221 9940)

**සටහන:**

ඉල්ලීමේ ලිපිය , විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල්ලිපිනය, අයදුම් පත්‍රයේ පිටපතක්, අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් යවන ලද තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, විභාග ගාස්තු ගෙවූ සහතික කරන ලද ජායා පිටපත , ප්‍රවේශ පත්‍රය යැවිය යුතු ෆැක්ස් අංකය.

## 09 පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිට සෑහීමකට පත්විය හැකි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරනමෙන් ඉල්ලා සිටිනු ලැබේ.පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමණ හෝ එකක් පිළිගණු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුණුම් පත .

(11) වළංගුවිදේශ ගමන් බලපත්‍රයක්. (Passport)

ඉහත සඳහන් ලේනයන්ගෙන් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම් කරුවෙකුගේ හිමිකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අභිමතය පරිදි අවලංගුකළ හැකිය. විභාගය පැවැත්වීම පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට අයදුම්කරුවන් අවනතවිය යුතුය. එකී නීති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත්විය යුතුය.

## 10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුයි. අයදුම්කරු සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, කුමන අවස්ථාවක හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කල හැක.

## 11 විභාග පරිපාටිය

(අ) මෙම විභාගය පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ මෙම පරික්ෂණය සිංහල හා දෙමළ යන භාෂා දෙකින් පවත්වනු ලැබේ. අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

### 11.1 විමර්ශන නිලධාරී III වන ශ්‍රේණි සඳහා විවෘත තරග විභාගය මගින් බඳවා ගැනීම

| අප | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය මගින් අයදුම්කරුගේ තර්ක කිරීමේ හැකියාව,සාමාන්‍ය බුද්ධිය,අවබෝධය,දෘශ්‍ය නිරීක්ෂණය,කේත කරණය,විසංකේත කරණය,ගැලපීම,සංඛ්‍යාත්මක අභියෝගතා,භාෂා ප්‍රවීණතාව වැනි දෑ පරීක්ෂා කෙරේ | පැය 01යි | 100 යි |
| 02 | ගිණුම්කරණය | ගිණුම්කරණ මූලධර්ම | පැය 01යි | 100 යි |

11.2 විමර්ශන නිලධාරී III වනි ශ්‍රේණී සඳහා සීමිත තරග විභාගය මගින් බඳවා ගැනිම

| අඅ | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය මගින් අයදුම්කරුගේ තර්ක කිරීමේ හැකියාව,සාමාන්‍ය බුද්ධිය,අවබෝධය,දෘශ්‍ය නිරීක්ෂණය,කේත කරණය,විසංකේත කරණය,ගැලපීම,සංඛ්‍යාත්මක අභියොගතා,භාෂා ප්‍රවීණතාව වැනි දෑ පරීක්ෂා කෙර් | පැය 01යි | 100 යි |
| 02 | කාර්යාල ක්‍රම හා ගිණුම්කරණය | 1. ද්විත්ව සටහන් මූලධර්ම, වාණිජ ක්‍රමයට ගිණුම් පොත් පවත්වාගෙන යාම,ලාභාලාබ ගිණුම,විසර්ජන ගිණුම, ප්‍රතිපාදන ගිණුම හා ශේෂ පත්‍රය<br>2. ජ්නල් භාවිතය, වාරික මුදල් හා සුළු මුදල් පොත් පවත්වා ගෙන යාම, බැංකු සැසඳුම් වාර්තාව, ක්ෂය වීම්, වෙන් කිරීම්, නිදන් අරමුදල් ගිණුම(Sinking Fund), අවිනිශ්චිත ගිණුම, අත්තිකාරම් ගෙවීම්, ලැබීම් හා ගෙවීම් ගිණුම<br>3. ගණකාධිකරණයේ මූලික අරමුණ, මුදල් ගිණුමේ අරමුණ, කාර්යාල පරිපාලනය හා ලිපි ගොණු පවත්වා ගැනීම | පැය 02යි | 100 යි |

**සටහන**

මෙම විභාගය තරග විභාගයක් වුවත් එයින් පත්වීමට සුදුසුකම් ලැවීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයන් සඳහා වෙන් කර ඇති ලකුනු වලින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය. ලබා ගත් මුලු ලකුණු පදනම් කරගෙන ලකුණු අනු පිලිවෙළට ( Merit Order) පත්වීම් ලබාදෙනු ලැබේ.

## 12 විභාග ප්‍රතිඵල

අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.np.gov.lk වෙබ් අඩවියෙහි පළ කරන අතර පසුවඋතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**13** මෙම විභාගය පැවැත්විම හා අවලංගු කිරිමේ බලය“**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්**” සතු වේ. ඒ සමගම දෙමළ හෝ සිංහල භාෂාවේ යම් කිසි වෙනසක් ඇතොත්, දෙමළ භාෂාවෙක් සඳහන් නිවේදනය නිවැරදි බව සළකියයුතුවේ.

*රූ.වරදලිංගම්*
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
2016.06.29